උත්තරීතර අල්ලාහ්ගේ හෙවණ හැර වෙනත් කිසිදු හෙවණක් නැති දිනයේ ඔහුගේ හෙවණ තුළ ඔහු හෙවණ ලබා දෙන හත් දෙනෙකු සිටිති

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "උත්තරීතර අල්ලාහ්ගේ හෙවණ හැර වෙනත්
කිසිදු හෙවණක් නැති දිනයේ ඔහුගේ හෙවණ තුළ ඔහු හෙවණ ලබා දෙන හත් දෙනෙකු සිටිති. යුක්ති ගරුක නායකයා, අල්ලාහ්ගේ නැමදුම තුළ වැඩුණු තරුණයා, දේවස්ථාන සමග ඔහුගේ හදවත බැඳුණු මිනිසා, අල්ලාහ් විෂයයෙහි එකිනෙකා ආදරය කරන මිනිසුන් දෙදෙනා, ඔවුන් දෙදෙනා ඔහු වෙනුවෙන් රැස්වෙති. ඔහු වෙනුවෙන් වෙන්ව යති. නිලය හා අලංකාරය ඇති
කාන්තාවක් ඔහුට (කාමයේ වරදවා හැසිරීමට) ඇරයුම් කළ විට, "සැබැවින්ම මම අල්ලාහ්ට බිය වෙමි" යැයි පවසන මිනිසා, ඔහුගේ දකුණත වියදම් කළ දෑ ඔහුගේ වමතට නොදැනෙන තරමට එය සඟවාගෙන දන් දෙන මිනිසා, හුදෙකලාවේ අල්ලාහ්ව මෙනෙහි කරමින් ඔහුගේ ඇස්වලින් කඳුළු සළන මිනිසා."
[صحيح] [متفق عليه]

උත්තරීතර අල්ලාහ්ගේ හෙවණ හැර වෙනත් කිසිදු හෙවණක් නැති දිනයේ ඔහුගේ හෙවණ තුළ ඔහු හෙවණ ලබා දෙන මුඃමින්වරුන් අතරින් කණ්ඩායම් හතකට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ශුභාරංචි දන්වා සිටියහ. පළමුවැන්නා: දූෂිත නැති තමන් තුළ යුක්ති ගරුක වූ නායකයා. ඔහුගේ යටතේ සිටින්නන් අතර කිසිදු අපාධයක් සිදු නො කරන පාලකයා. ඔහු කටයුතු භාරව ක්රියා කරන තැනැත්තාය. මුස්ලිම්වරුන්ගේ කටයුතු අතරින් කිසිවක් භාරගෙන එහි යුක්ති සහගත ලෙස කටයුතු කරන සෑම කෙනෙකුම මෙහි ඇතුළත් වේ. දෙවැන්නා: අල්ලාහ්ගේ නැමදුම තුළ වැඩුණු තරුණයා, ඔහු එය පූර්ණ කරන තෙක් ඔහුගේ යෞවනය හා ඔහුගේ උත්සාහය එහි ගත කරයි. තුන්වැන්නා: දේවස්ථානය සමග තම හදවත නිතර බැඳුණු මිනිසා. ඔහු ඉන් පිටව ගිය විටත් ඒ ගැන තිබෙන දැඩි ආශාව හේතුවෙන් නැවතත් ඒ වෙත පිය නගයි. දේවස්ථානයෙන් පිටත ඔහු සිටිය ද යම් කිසි බාධකයක් ශරීරයට ඇති වුව ද හදවතින් ඔහු එහි දිගටම බොහෝ සෙයින් රැඳී සිටියි. සිව්වැන්නා: අල්ලාහ් විෂයයෙහි එකිනෙකා සැබෑ ලෙස ආදරය කරන මිනිසුන් දෙදෙනා, ඔවුන් දෙදෙනා ආගමික විෂයයෙහි අඛණ්ඩව රැඳී සිටිති. ලෞකික කටයුත්තක් හේතුවෙන් එය කපා නොහරිති. මරණය ඔවුන් දෙදෙනා අතර වෙන් කරන තෙක්ම සැබෑ ලෙස හෝ එසේ නොවූව ද එක් රැස් වෙති. පස්වැන්නා: අශිලාචාර කටයුත්තක් සඳහා තමන් ඇසුරට පැමිණෙන මෙන් අලංකාරමත් උසස් නිලයේ කීර්තිය ධනය හා අලංකාරය ඇති කාන්තාවක් ඔහුට ඇරයුම් කළ විට ඔහු එය ප්රතික්ෂේප කොට ඇයට: "සැබැවින්ම මම අල්ලාහ්ට බිය වෙමි" යැයි පවසන මිනිසා. සයවැන්නා: සුළු පරිමාණයේ හෝ මහා පරිමාණයේ දන්දීමක් වුව ද එය ප්රදර්ශනය නොකර ඔහුගේ දකුණත වියදම් කළ දෑ ඔහුගේ වමතට නො දැනෙන තරමට සඟවාගෙන දන් දෙන මිනිසා. සත්වැන්නා: මිනිසුන්ගෙන් දුරස්ව හුදෙකලාවේ සිටිය දී උත්තරීතර අල්ලාහ් වෙත ඇති බිය හා මහිමය නිසාවෙන් ඔහු ගැන තම හදවතින් සිහි ගන්වා, දිවෙන් මෙනෙහි කර, ඔහුගේ ඇස්වලින් කඳුළු සළන මිනිසා.

http://sunnah.global/hadeeth/si/show/66234